# සහනාධාරයෙන් ඔබ්බට ගිය සහභාගීත්ව සංවර්ධනය: 'ප්‍රජා ශක්ති' අත්හදාබැලීම, බිම් මට්ටමේ යථාර්ථය සහ ග්‍රාමීය ප්‍රජාතන්ත්‍රවාදය




RIGHT TO LIFE
HUMAN RIGHTS CENTRE

## Contents

1.1 සහනාධාරයෙන් ඔබ්බට ගිය සහභාගීත්ව සංවර්ධනය: 'ප්‍රජා ශක්ති' අත්හදාබැලීම, බිම් මට්ටමේ යථාර්ථය සහ ග්‍රාමීය ප්‍රජාතන්ත්‍රවාදය........................1

1.2 අස්වැසුමෙන් උගත් පාඩම් සහ පරිපාලනමය අර්බුදයේ ව්‍යුහ විද්‍යාව ...........2

1.3 'ප්‍රජා ශක්ති' සහ සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශයේ (Participatory Development) දාර්ශනික පදනම........................................................................................................3

1.4 ප්‍රජා සංවර්ධන සභාවල (CDC) නව සහ විස්තීර්ණ ව්‍යුහය.................................5

1.5 බිම් මට්ටමේ තීරණ ගැනීම සහ දත්ත මත පදනම් වූ සංවර්ධනය................6

2. ආයතනික ගැටුම් වළක්වා ගැනීම සහ සම්පත් සම්බන්ධීකරණය ......................6

2.1 ග්‍රාමීය ප්‍රජාතන්ත්‍රවාදයේ විභවය: මහාචාර්ය ජයදේව උයන්ගොඩගේ කියවීම ..........................................................................................................................7

2.2 යථාර්ථය සහ දේශපාලනීකරණයේ අවදානම: සිවිල් සමාජ කතිකාව සහ විවේචනය ........................................................................................................................7

2.3 ඉදිරි දැක්ම: නීතිගත කිරීම සහ සමාජ වගකීම..................................................8

## 1.1 සහනාධාරයෙන් ඔබ්බට ගිය සහභාගීත්ව සංවර්ධනය: 'ප්‍රජා ශක්ති' අත්හදාබැලීම, බිම් මට්ටමේ යථාර්ථය සහ ග්‍රාමීය ප්‍රජාතන්ත්‍රවාදය

**සිවිල් සමාජ ක්‍රියාකාරිකයකුගේ දෘෂ්ටි කෝණයෙන් - අජිත් පැරකුම් ජයසිංහ**

වර්තමාන යුද සංදර්භය සහ ගෝලීය අර්බුද හමුවේ ලෝකයේ මෙන්ම ශ්‍රී ලංකාවේ ද ආර්ථිකයට දැඩි බලපෑම් එල්ල වෙමින් පවතී. මේ හේතුවෙන් ඉදිරියේදී දිළිඳුකම තවදුරටත් වැඩි වීමට පවා ඉඩ තිබේ. එබැවින් දිළිඳුභාවයට එරෙහි සටන වෙනදාට වඩා තීව්‍ර කළ යුතු යුගයක් උදා වී ඇත. 2022 වසරේ ශ්‍රී ලංකාව මුහුණ දුන් ඓතිහාසික හා බරපතළ ආර්ථික අර්බුදයත් සමඟ මෙරට සමාජ දේහය පුරා දිළිඳුභාවය ශීඝ්‍රයෙන් පැතිර ගියේය. මෙම ව්‍යසනකාරී තත්ත්වය හමුවේ, හුදු සහනාධාර බෙදාදීමේ යල්පැනගිය ආකෘතිවලින් ඔබ්බට ගිය තිරසර විසඳුමක අවශ්‍යතාව සිවිල් සමාජය විසින් දැඩිව මතු කරන ලදි. විශේෂයෙන්ම රයිට් ටු ලයිෆ් මානව හිමිකම් මධ්‍යස්ථානය සමග එක්ව, අපි මේ සම්බන්ධයෙන් මැදිහත්වීමක් කළෙමු. නව සමාජ ආරක්ෂණ ක්‍රමයක් ලෙස 'අස්වැසුම' හඳුන්වා දෙන සමයේදී, දිළිඳුභාවය පිටුදැකීමේ වැඩසටහන් පිළිබඳ පුළුල් පදනම් අධ්‍යයනයක් (Baseline Study) සිදු කරමින් මේ පිළිබඳ කතිකාවක් සමාජගත කිරීමට අපි උත්සාහ කළෙමු.



එම අධ්‍යයනයෙන් මනාව පැහැදිලි වූයේ, දශක ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාව ක්‍රියාත්මක කළ සමාජ ආරක්ෂණ වැඩසටහන්වල බරපතළ ගැටලු ඇති බවයි. එක පැත්තකින් ඒවා දේශපාලනීකරණය වී ඇති අතර, එමඟින් ජනතාව නිෂ්පාදන ක්‍රියාවලියට සක්‍රියව දායක කරගත හැකි පරිදි නගාසිටුවනවා වෙනුවට සදාකාලිකව රජයේ ආධාර මත යැපෙන 'යැපුම් මානසිකත්වයක්' (Dependency Syndrome) ප්‍රවර්ධනය කිරීම ද සිදු වේ. දිළිඳුභාවයෙන් ගොඩ ඒමට ප්‍රමාණවත් උත්සාහයක් නොදරන නිෂ්ක්‍රිය පුරවැසියන් පිරිසක් ද සමාජයේ නිර්මාණය වේ.

## 1.2 අස්වැසුමෙන් උගත් පාඩම් සහ පරිපාලනමය අර්බුදයේ ව්‍යුහ විද්‍යාව

අස්වැසුම වැඩසටහන 'බහුවිධ දරිද්‍රතාව' (Multidimensional Poverty) යන සංකල්පය පදනම් කරගනිමින් හඳුන්වා දෙන ලදි. දරිද්‍රතාව යනු හුදු ආදායම නොමැතිකම පමණක් නොවන බවත්, එය අධ්‍යාපනය, සෞඛ්‍යය, නිවාස, සහ සමාජ ආරක්ෂණය යන බහුවිධ සාධක මත තීරණය වන්නක් බවත් පිළිගැනීම ප්‍රශංසනීය වේ. එහෙත් එය බිම් මට්ටමේදී ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රණය අභියෝගාත්මක විය. විශේෂයෙන්ම ග්‍රාම නිලධාරීවරුන්ගේ සහ සමෘද්ධි නිලධාරීවරුන්ගේ වර්ජන සහ සහයෝගය නොදැක්වීම් හමුවේ දත්ත එක්රැස් කිරීම අඩාල විය. ප්‍රමාණවත් තරම් නිසි විමර්ශන, ක්ෂේත්‍ර අධ්‍යයන හෝ පසු විපරම් අධීක්ෂණයන් සිදු නොවීම හේතුවෙන්, ඇතැම් විට සැබවින්ම ආධාර ලැබිය යුතු අන්ත දිළිඳුන්ට ප්‍රතිලාභ අහිමි වී, නුසුදුස්සන් ලැයිස්තුගත වීම පවා දක්නට ලැබිණි. මුල් වටයේ තෝරාගැනීම්වලට එරෙහිව අභියාචනා සහ විරෝධතා රැසක් එල්ල විය.




මෙම තත්ත්වය වඩාත් ගැඹුරින් වටහාගැනීම සඳහා අස්වැසුම බිහිවූ පසුබිම අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍ය වේ. 'අස්වැසුම' යනු හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ රජය සමයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) සහ ලෝක බැංකුවේ (World Bank) කොන්දේසි හා යෝජනා මත සෘජුවම හඳුන්වා දුන් වැඩසටහනකි. එහි මූලික ඉලක්කය වූයේ ආර්ථික අර්බුදය සහ ප්‍රතිසංස්කරණ හමුවේ පීඩාවට පත්වන ජනතාව සඳහා හුදු 'සමාජ ආරක්ෂණ දැලක්' (Social Safety Net) සැපයීමයි. එසේම සමෘද්ධි ව්‍යාපාරයේ තිබූ ආධාර බෙදීමේ ක්‍රමය වඩාත් විධිමත් ඉලක්කගත මුදල් හුවමාරුවක් (Targeted Cash Transfer) බවට පත් කිරීම එහි තවත් අරමුණක් විය. දිළිඳු බවින් මිදීම සඳහා අත්‍යවශ්‍ය වන ක්ෂුද්‍ර හා කුඩා ව්‍යවසායකත්වය නඟාසිටුවීම වෙනුවෙන් ප්‍රමාණවත් හා ඵලදායී වැඩසටහන් මීට පෙර ජනසවිය හා සමෘද්ධි වැඩසටහන්වල දක්නට ලැබිණි. එහෙත් අස්වැසුම සුබසාධන ප්‍රතිලාභ ක්‍රමයෙහි ඒවා දක්නට නොලැබිණි. එය හුදෙක්ම මූල්‍ය ආධාර හුවමාරුවක් පමණක් විය.



1989 දී ආරම්භ වූ ජනසවිය සහ පසුව පැමිණි සමෘද්ධිය වැනි වැඩසටහන්වල මූලික අරමුණ වූයේ ද දිළිඳු ජනතාව සවිබල ගැන්වීමයි. කාලයත් සමඟ ඒවා දැවැන්ත ලෙස දේශපාලන බලපෑමට ලක් විය. මේ තත්ත්වය තුළ, හුදෙක් මුදල් බෙදා දීමෙන් ඔබ්බට ගොස් මානව ප්‍රාග්ධනය දියුණු කරන, ආකල්පමය වෙනසක් නිර්මාණය කරන සහ නිෂ්පාදන ආර්ථිකයට ප්‍රජාව සම්බන්ධ කරන නව ප්‍රවේශයක අවශ්‍යතාව සමාජය තුළ උද්ගතව තිබිණි. වත්මන් ජාතික ජන බලවේග රජය විසින් "ප්‍රජා ශක්ති" නමින් දිළිඳුකම තුරන් කිරීමේ ජාතික ව්‍යාපාරය ආරම්භ කරන්නේ මෙම ඓතිහාසික රික්තකය පිරවීමේ අරමුණෙන් බව ප්‍රකාශයට පත් කර තිබේ.

කෙසේ වෙතත්, අස්වැසුම වැඩසටහනේ ධනාත්මක පැතිකඩ ද අප කිසිසේත් අවතක්සේරු නොකළ යුතුය. විශේෂයෙන්ම, දේශපාලන අතපෙවීම් අවම කිරීම සඳහා තාක්ෂණය යොදා ගනිමින්, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය හරහා විධිමත් (Refined) සහ පුළුල් දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීමට ගත් උත්සාහය ඉතා ප්‍රශංසනීය වේ. පෙර පැවති සමෘද්ධි ආධාර ලබා දීමේ ක්‍රමය වෙනුවට, ප්‍රතිලාභීන්ගේ බැංකු ගිණුම්වලට සෘජුවම මුදල් බැර කිරීමේ විනිවිද පෙනෙනසුලු යාන්ත්‍රණයක් හඳුන්වා දීම එහි තවත් සුවිශේෂී ජයග්‍රහණයකි. සමාජයේ සහ ආර්ථිකයේ සිදු වන වෙනස්කම් හමුවේ, අද දිළිඳු පවුලක් හෙට දින සවිබල ගැන්වී◌ෙ හෝ මධ්‍යම පාන්තික පවුලක් හදිසි ආපදාවකින් අන්ත දිළිඳුභාවයට පත් වීමට ඉඩ තිබේ. එබැවින්, මෙම තොරතුරු පද්ධතිය අඛණ්ඩව යාවත්කාලීන කිරීමේ අත්‍යවශ්‍යතාව ද මෙහිදී දැඩිව අවධාරණය කළ යුතුය. ඉදිරි වැඩසටහන්වල කාර්යක්ෂමතාව සහ ඵලදායී භාවය තීරණය වනු ඇත්තේ, අස්වැසුමෙන් ආරම්භ කළ මෙම දත්ත පද්ධතිය තවදුරටත් විධිමත් කරමින්, තත්කාලීන (Realtime) තොරතුරු මත පදනම්ව එය අඛණ්ඩව යාවත්කාලීන කරමින් නඩත්තු කිරීම මතය.

## 1.3 'ප්‍රජා ශක්ති' සහ සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශයේ (Participatory Development) දාර්ශනික පදනම

ප්‍රජා ශක්ති යනු තවත් එක් සාමාන්‍ය රාජ්‍ය සුබසාධන ව්‍යාපෘතියක් හෝ අමාත්‍යාංශයකට සීමා වූ ව්‍යාපෘතියක් නොවන බව පවසමින් ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍ය ආචාර්ය උපාලි පන්නිලගේ පෙන්වා දෙන පරිදි, මෙහි ප්‍රධාන අරමුණු හතරක් ඇත. ඒවා නම්:

1. දිළිඳුභාවය දුරලීම සඳහා සෘජු ජාතික නායකත්වයක් ලබාදීම.
2. ග්‍රාමීය දිළිඳුකම තුරන් කිරීමේ ක්‍රියාවලියට සමස්ත රාජ්‍ය අංශයම සම්බන්ධ කරගන්නා ඒකාබද්ධ හා අන්තර්ග්‍රාහී (Inclusive) සංවර්ධන ප්‍රවේශයක් ලබාදීම.
3. ග්‍රාමීය දිළිඳුභාවය පිටුදැකීම සඳහා ජන සහභාගීත්ව සංවර්ධන ප්‍රවේශයක් අනුගමනය කිරීම.
4. දිළිඳුකම තුරන් කිරීමේ වැඩසටහන්වල කාර්යසාධනය සහ කාර්යක්ෂමතාව සමාජ විගණනයක් හරහා ජනතා සහභාගීත්වයෙන් විමර්ශනයට හා ඇගයීමට ලක්කිරීම.

නොබෙල් ත්‍යාගලාභී ආර්ථික විද්‍යාඥ අමර්ත්‍යා සෙන්ගේ දර්ශනයට අනුව, "සංවර්ධනය යනු, ඉගෙනීමට, උපයා ගැනීමට, සහභාගි වීමට සහ ගෞරවාන්විතව ජීවත් වීමට ඇති ජනතාවගේ නිදහස පුළුල් කිරීමයි."

ප්‍රජා ශක්ති ව්‍යාපාරය ද මෙම න්‍යාය මත පිහිටමින්, ප්‍රධාන කුලුනු හයක් මත ගොඩනඟා ඇත. ඒවා නම්: සමාජ පරිසරය, ආහාර සුරක්ෂිතතාව, සැපයුම් ජාල සහ ප්‍රවේශය, මානව සම්පත් සංවර්ධනය, සමාජ ආරක්ෂණය සහ නිෂ්පාදන ආර්ථිකයයි. මෙහිදී පහළ සිට ඉහළට (Bottom-up) සංවර්ධනය සැලසුම් කිරීමේ බලය ගමට ලබාදීමට අපේක්ෂා කෙරේ.



මෙරට සහභාගීත්ව සංවර්ධනයේ පුරෝගාමියෙකු මෙන්ම 'ජනසවිය' වැඩසටහනේ ප්‍රධාන නිර්මාණකරුවෙකු වූ විශිෂ්ට පරිපාලන නිලධාරි අභාවප්‍රාප්ත ආචාර්ය සුසිල් සිරිවර්ධනයන් නිරතුරුවම වැදගත් කරුණක් අවධාරණය කළේය. "දුප්පතුන් යනු සංවර්ධනයේ වස්තූන් (Objects) නොව, එහි කර්තෘන් (Subjects) විය යුතු" බව ඔහු පෙන්වා දුන්නේය. දිළිඳු ජනතාව තුළ සැඟවී ඇති නිර්මාණාත්මක ශක්තිය කෙරෙහි රජය විශ්වාසයක් තැබිය යුතුය. රාජ්‍ය නිලධාරීන් හුදෙක් නියෝග දෙන්නන් නොවී 'පහසුකාරකවරුන්' (Facilitators) බවට පත්විය යුතු බව ඔහු වැඩිදුරටත් පෙන්වා දුන්නේය. ප්‍රජා ශක්ති වැඩසටහනේ දාර්ශනික පදනම ද ප්‍රතිරාවය කරන්නේ මෙම සමාජ සජීවීකරණ (Social Mobilization) සංකල්පයයි.

මෙම සහභාගීත්ව සංවර්ධන සංකල්පය සහ බලය විමධ්‍යගත කිරීමේ උත්සාහයන් ශ්‍රී ලංකාවට කිසිසේත්ම නවමු අත්දැකීමක් නොවේ. අතීතයේ පැවති ගම්සභා ක්‍රමයේ සිට, ග්‍රාම සංවර්ධන සමිති සහ 1980 දශකයේ හඳුන්වා දුන් 'ග්‍රාමෝදය මණ්ඩල' වැනි විවිධ ආකෘති හරහා ජනතාව තීරණ ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීමට විවිධ යුගවලදී උත්සාහ කර ඇත. එහෙත් කල් යෑමේදී මෙම බොහෝ ආයතන දැඩි ලෙස දේශපාලනීකරණයට ලක් වීම සහ නිලධාරිවාදයට කොටු වීම හේතුවෙන් ඒවායේ ස්වාධීනත්වය සම්පූර්ණයෙන්ම අහිමි වී ගියේය. එබැවින් 'ප්‍රජා ශක්ති' වැඩසටහන හමුවේ ඇති ප්‍රධානතම අභියෝගය වන්නේ ඉතිහාසයේ සිදු වූ එම ආයතනික වැරදි යළිත් පුනරාවර්තනය වීමට ඉඩ නොදී, සැබෑ මහජන හිමිකාරිත්වයක් තහවුරු කර ගැනීමයි.





## 1.4 ප්‍රජා සංවර්ධන සභාවල (CDC) නව සහ විස්තීර්ණ ව්‍යූහය

මෙම සහභාගීත්ව සංවර්ධනයේ ජීවය සහ හදගැස්ම වන්නේ දිවයින පුරා ග්‍රාම නිලධාරි වසම් 14,000ක් පමණ සංඛ්‍යාවක් පුරා පිහිටුවන 'ප්‍රජා සංවර්ධන සභා' (Community Development Councils) ය. ප්‍රජා සංවර්ධන සභාවක උපරිම සාමාජිකත්වය 35ක් වේ. වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී සහ සාකල්‍යවාදී ව්‍යූහයක් ඊට හඳුන්වා දී ඇත. එහි සංයුතිය මෙසේය:

- **සභාපති හා ලේකම් (නිලධාරීන් 04):** සභාපතිත්වය හිමිවන්නේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයාට හෝ ඔහු විසින් පත් කරන මහජන නියෝජිතයෙකුටය. 'ප්‍රජා සවිබලගැන්වීමේ නිලධාරි' ලෙස වසර තුනක කාලයක් සඳහා අනුයුක්ත කර ඇති ආර්ථික සංවර්ධන නිලධාරීන් මෙහි ලේ කම්වරයා ලෙස කටයුතු කරයි.
- **කාරක සභාව (නිල නියෝජිතයින් 05):** ග්‍රාම නිලධාරි, සමෘද්ධි නිලධාරි, කෘෂි පර්යේෂණ නිලධාරි ඇතුළු ගමේ රාජ්‍ය පරිපාලනය නියෝජනය කරන නිලධාරීන් මෙයට අයත් වේ.
- **ප්‍රජා නියෝජිතයින් (උපරිම 15):** මෙය අතිශය වැදගත් අංගයකි. මෙහිදී හුදෙක් දිළිඳු ජනතාව පමණක් නොව කාන්තාවන්, තරුණයන්, ධනවත් අය මෙන්ම විවිධ වාර්ගික නියෝජිතයින් ද ඇතුළත් සැබෑ බිම් මට්ටමේ හරස්කඩක් නියෝජනය වේ.
- **උපායමාර්ගික කමිටුව (Strategic Committee):** ප්‍රදේශයේ ව්‍යවසායකයින්, රාජ්‍ය සේවකයින්, විදෙස්ගත ප්‍රජාව සහ විද්වතුන්ගෙන් සැදුම්ලත් පහසුකරණය සපයන අත්දැකීම් සහිත උපදේශක මණ්ඩලයක් ලෙස මෙය ක්‍රියාත්මක වේ.





නිශ්චිත භූමියක් තුළ එකට ජීවත් වන ජන සමූහයක්, තම දැනුමෙන්, කුසලතාවලින් සහ ආකල්පවලින් සන්නද්ධ කර බලමුළුගැන්වීම මෙහිදී අපේක්ෂා කෙරේ. සංවර්ධන ගැටලුවක් හඳුනාගැනීමේ සිට, විශ්ලේෂණය, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම යන සම්පූර්ණ සංවර්ධන චක්‍රයම ජන සහභාගීත්වයෙන් සිදු කිරීම මෙහි මූලික අරමුණයි.

## 1.5 බිම් මට්ටමේ තීරණ ගැනීම සහ දත්ත මත පදනම් වූ සංවර්ධනය

මෙම ප්‍රජා සභාවලට හිමිව ඇති වගකීම අතිමහත්ය. **ජනාධිපති මාධ්‍ය අංශය මගින් නිකුත් කළ ලිපියකදී ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් කපිල ජානක බණ්ඩාර මහතා** ප්‍රජා සංවර්ධන සභාවල කාර්යභාරය නිර්වචනය කර තිබුණේ මෙසේය:


"ප්‍රජා සංවර්ධන සභාවල කාර්යභාරය කුමක් ද? එමගින් බිම් මට්ටමේ තීරණ ගැනීම සඳහා අවශ්‍ය අවබෝධය සැපයේ. ගමේ සැබෑ ගැටලු මොනවා ද, වඩාත්ම අවදානමට ලක් විය හැකි කුටුම්භ මොනවා ද, කුමන ආකාරයේ මැදිහත්වීම්වලට ප්‍රමුඛත්වය දිය යුතු ද, ලබා දෙන සේවාවන් සැබැවින්ම ආන්තික පවුල් වෙත ළඟා වේ ද ආදී කරුණු මේවා හරහා හඳුනා ගැනේ. මෙම තොරතුරු ප්‍රජා ශක්ති කළමනාකරණ තොරතුරු පද්ධතිය ඔස්සේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දක්වා, අනතුරුව, දිස්ත්‍රික්කයට, පළාතට සහ අවසානයේ ජාතික මට්ටම දක්වා ඉහළට ගමන් කරයි. ඒ අනුව, පළමුවරට, උපකල්පනය කිරීමක්, දේශපාලන බලපෑමක්, අනුමාන කිරීමක් නොවී ක්‍රමානුකූලව එකතු කරන ලද ගම් මට්ටමේ තොරතුරු මගින් සංවර්ධන තීරණ ගැනීමේ ක්‍රියාවලිය මෙහෙයවීමට හැකි වේ. මෙය සුබසාධනයෙන් සවිබලගැන්වීම දක්වා මාරුවීමකි."

## 2. ආයතනික ගැටුම් වළක්වා ගැනීම සහ සම්පත් සම්බන්ධීකරණය

මෙම නව ව්‍යුහය ස්ථාපිත කිරීමේදී සමාජයේ මතු වූ සාධාරණ සැකයක් තිබිණි. දැනටමත් ග්‍රාමීය මට්ටමේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන (ප්‍රාදේශීය සභා ආදිය) සහ ප්‍රජා සංවර්ධන සභා අතර බලතල පිළිබඳ ගැටුමක් නිර්මාණය වේ ද යන්න එම සැකයයි. එහෙත් ප්‍රජා ශක්ති වැඩසටහන තුළ මෙම ආයතනික ගැටුම වළක්වා ගැනීම සඳහා පැහැදිලි සීමාවන් දක්වා ඇති බව **ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්වරයා සිය ලිපියෙන්** තවදුරටත් අවධාරණය කර තිබිණි.

"ප්‍රජා ශක්ති කිසිවකුගේ අධිකාරි බලය බැහැර නොකරයි. එයින් සමාන්තර ව්‍යුහයක් නිර්මාණය නොකරයි. ඉන් සම්බන්ධීකරණය ශක්තිමත් කෙරෙන අතර, පවතින ආයතන අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකා සිදු කරන සේවය අගයමින්, ගම් මට්ටමේ දිළිඳු බව අවම කිරීම සඳහා එම ආයතනවල සම්පත් පෙළගැස්වීම සහතික කරයි."

මෙයින් ගම්‍ය වන්නේ ප්‍රජා සංවර්ධන සභාවලට මූල්‍ය හෝ විධායක අධිකාරියක් නොමැති බවයි. එය අයවැය සම්මත කරන හෝ අරමුදල් රැස්කරන ආයතනයක් නොවේ. පවතින රාජ්‍ය සම්පත් වඩාත් ඵලදායීව සහ ප්‍රමුඛතා පදනමක් මත ගමට ලබාගැනීම සඳහා ජනතාව නියෝජනය කරන 'මාර්ගෝපදේශක සභාවක්' ලෙස එය ක්‍රියාත්මක වේ.



## 2.1 ග්‍රාමීය ප්‍රජාතන්ත්‍රවාදයේ විභවය: මහාචාර්ය ජයදේව උයන්ගොඩගේ කියවීම

සිවිල් සමාජ දෘෂ්ටි කෝණයකින් බලන කල, මෙම වැඩසටහනේ වැදගත්ම මානය වන්නේ එහි ඇති දේශපාලනික හා ප්‍රජාතන්ත්‍රවාදී විභවයයි. කීර්තිමත් දේශපාලන විද්‍යාඥ **මහාචාර්ය ජයදේව උයන්ගොඩ මහතා 2026 පෙබරවාරි 08 වැනිදා 'සිළුමිණ' පුවත්පතට ලියූ ලිපියක් මඟින්** මෙම මැදිහත්වීම විග්‍රහ කර තිබේ. ඔහු එය දකින්නේ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය බිම් මට්ටමෙන් ගැඹුරු කිරීමේ ස්වර්ණමය අත්හදාබැලීමක් ලෙසිනි.

උයන්ගොඩ මහතා එහිදී පෙන්වා දුන් පරිදි, **"නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයෙන් බිහිවන 'නිෂ්ක්‍රිය පුරවැසියන්' වෙනුවට, සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදයෙන් 'සක්‍රිය පුරවැසියන්' නිර්මාණය කිරීම ප්‍රජා ශක්ති ව්‍යාපාරයේ අරමුණයි."** දශක ගණනාවක් පුරා ශ්‍රී ලංකාවේ ග්‍රාමීය සමාජයේ බලය කේන්ද්‍රගත වී තිබුණේ ඉඩම් හිමි හෝ ධන හිමි සුළුතර ප්‍රභූ පැලැන්තියක් අතේය. එහෙත්, ප්‍රජා සංවර්ධන සභා නිසි පරිදි ක්‍රියාත්මක වී සමාජය තුළ මුල්බැසගතහොත්, එහි අනිවාර්ය සමාජ හා දේශපාලන ප්‍රතිඵලය වනු ඇත්තේ ග්‍රාමීය සමාජයේ බල ව්‍යූහයේ එම ප්‍රභූ ආධිපත්‍යය දෙදරා යෑමයි.

මෙම අදහස තහවුරු කරමින් **අමාත්‍ය ආචාර්ය උපාලි පන්නිලගේ මහතා පෙබරවාරි 01 වැනිදා 'සිළුමිණ' පුවත්පතට ලබාදුන් සම්මුඛ සාකච්ඡාවකදී** පවසා තිබුණේ, **"කලින් වගේ කවුරු හරි මන්ත්‍රීවරයෙකුට හෝ රාජ්‍ය නිලධාරියෙකුට ඔවුන්ට අවශ්‍ය විදිහට ගමේ සංවර්ධනය තීරණය කරන්න දැන් බැහැ,"** යනුවෙනි. එනම් දේශපාලන අධිකාරියත්, රාජ්‍යයත්, විද්වතුනුත්, ප්‍රජා නියෝජිතයනුත් එකම වේදිකාවකට පැමිණීමයි.

## 2.2 යථාර්ථය සහ දේශපාලනීකරණයේ අවදානම: සිවිල් සමාජ කතිකාව සහ විවේචනය

කෙසේ වෙතත්, න්‍යායාත්මකව ප්‍රජා ශක්ති වැඩසටහන යහපත් එකක් වුව ද, සිවිල් සමාජ ක්‍රියාකාරීන් ලෙස අපට බිම් මට්ටමේ යථාර්ථය සහ භූමියේ හැසිරීම කිසිසේත්ම නොසලකා හැරිය නොහැක. රජයේ ලේඛනවල පවා මෙම පද්ධතියේ සාර්ථකත්වය රඳාපවතින මූලික කොන්දේසි ඉතා පැහැදිලිව දක්වා ඇත. **ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් කපිල ජානක බණ්ඩාර මහතාගේ** ලිපියෙහි ද එය මෙසේ අවධාරණය කර තිබිණි:

"සහභාගිත්ව පද්ධති සාර්ථක වන්නේ එම පද්ධතියේ හිමිකාරිත්වය ප්‍රජාව විසින් දරනු ලබන විටදී පමණි. ප්‍රජා සංවර්ධන සභා හුදු සංකේතාත්මක ආයතන පමණක් බවට පත් නොවිය යුතුය. ඒවායේ කාන්තාවන්, තරුණයන් සහ ආන්තික කණ්ඩායම්වල අව්‍යාජ හඬ ඇතුළත් විය යුතුය. රැස්වීම් කටයුතු විනිවිද පෙනෙනසුලු විය යුතුය. දත්ත නිවැරදි විය යුතුය. අඛණ්ඩ ප්‍රතිපෝෂණ සිදු විය යුතුය."

ප්‍රායෝගික තලයේදී මෙය සැබැවින්ම මෙසේ වන්නේ නැත. වැඩසටහනේ ප්‍රකාශිත අරමුණ 'සියල්ලන් ඇතුළත් කරගැනීම' වේ. ප්‍රායෝගිකව ක්‍රියාත්මක වීමේදී මෙය පොදු ජාතික වැඩසටහනකට වඩා පාලක පක්ෂයේ දේශපාලනික ව්‍යාපෘතියක් ලෙස නිරූපණය වීමේ බරපතළ අවදානමක් සහ ප්‍රවණතාවක් මේ වන

විටත් මතු වී තිබේ. ශ්‍රී ලංකා සමාජයේ පවතින දැඩි දේශපාලනික ධ්‍රැවීකරණය (Political Polarization) හේතුවෙන්, විරුද්ධ පක්ෂවලට සම්බන්ධ හෝ ස්වාධීන මත දරන පුරවැසියන් මෙම වැඩසටහනෙන් ස්වයංවම දුරස්ථ වී සිටිති. ඒ හා සමානවම පවත්නා යාන්ත්‍රණය විසින් ඔවුන්ව සියුම් ලෙස බැහැර කිරීමත් එක වර සිදුවෙමින් පවතී.





විශේෂයෙන්ම, ප්‍රජා සංවර්ධන සභාවල සභාපතිත්වය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරයාට හිමි වේ. වෙනත් වචනවලින් කිවහොත් එය පාලක පක්ෂයේ දේශපාලන අධිකාරියට හිමි වේ. ඒ හරහා, කමිටු සාමාජිකයින් (විශේෂයෙන්ම ප්‍රජා නියෝජිතයින් 15 දෙනා සහ උපායමාර්ගික කමිටුව) තෝරාගැනීමේදී දේශපාලනික හිතවත්කම් සහ දෘෂ්ටිවාදීමය ගැළපීම් මත පදනම් වන බවට චෝදනා එල්ල වෙමින් පවතී. ගමේ සැබෑ ප්‍රශ්න දන්නා, වසර ගණනාවක් තිස්සේ ස්වේච්ඡා සමිතිවල කටයුතු කළ විරුද්ධ පක්ෂවලට සම්බන්ධ හෝ ස්වාධීන හෝ පුරවැසි නායකයන් දේශපාලන හේතු මත මෙම සභාවලින් ප්‍රතික්ෂේප කරන්නේ නම්, ප්‍රජා සංවර්ධන සභාවල ප්‍රකාශිත සම්භාව්‍ය අරමුණ ඉටු වන්නේ නැත. එය ඉහත අප උපුටා දැක්වූ "හිමිකාරිත්වය ප්‍රජාව විසින් දැරීමේ" සහභාගීත්ව සංවර්ධන මූලධර්මයට එල්ල කරන මරු පහරකි.

## 2.3 ඉදිරි දැක්ම: නීතිගත කිරීම සහ සමාජ වගකීම

මෙම දේශපාලනීකරණ අවදානම සහ අඩුපාඩු මගහරවා ගනිමින් වැඩසටහනේ තිරසරභාවය තහවුරු කිරීම සඳහා රජය එක් සාධනීය පියවරක් ගෙන තිබේ. ප්‍රජා ශක්ති යාන්ත්‍රණයේ නීතිමය ව්‍යූහය ශක්තිමත් කිරීමට අදාළ පනතක් පාර්ලිමේන්තුවේ සම්මත කරගැනීම සඳහා කැබිනට් අනුමැතිය ලබාගැනීම එම පියවරයි. එය හුදු චක්‍රලේඛයක් මත රඳා පවතිනවාට වඩා නීතිගත වීම වැදගත් වේ. ඒ හරහා දේශපාලන ඇඟිලි ගැසීම් යම්තාක් දුරකට හෝ නීතිමය රාමුවක් තුළ පාලනය කරගැනීමට හැකියාව ලැබේ.

ආණ්ඩු පෙරළියකදී වුව ද අඛණ්ඩ රාජ්‍ය ප්‍රතිපත්තියක් ලෙස එය ඉදිරියට ගෙන යාමට හැකිවනු ඇතැයි අපේක්ෂා කළ හැකිය. එමෙන්ම, මහජන ආරක්ෂක කමිටු නියෝජිතයන් ලෙස සහ අස්වැසුම තෝරාගැනීමේ කමිටුවල නිරීක්ෂකයින් ලෙස ද මෙම ප්‍රජා සභා සාමාජිකයින්ට කටයුතු කිරීමට අවස්ථාව ලබාදීම ද අගය කළ යුතුය. එමගින් සමස්ත පද්ධතියේම විනිවිදභාවය ඉහළ නැංවීමට හැකි වේ.

අවසන් වශයෙන් කිව යුත්තේ, 'ප්‍රජා ශක්ති' යනු හුදු දිළිඳුකම පිටුදැකීමේ ව්‍යාපෘතියක් පමණක් නොවන, ආර්ථික සමානාත්මතාව සහ ග්‍රාමීය සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදය යළි ගොඩනැඟීම සඳහා රාජ්‍යය විසින් දියත් කර ඇති දැවැන්ත සමාජ-දේශපාලනික අත්හදාබැලීමක් බවට පත් කළ හැකි බවයි. එබැවින්, එය හුදු පටු දේශපාලන උවමනාවන්ට යට වීමට ඉඩ නොදිය යුතුය.

එය ගමේ සියලුම හඬවල් (කාන්තා, තරුණ, ආන්තික කණ්ඩායම්, විවිධ ජාතීන් සහ විවිධ දේශපාලන මත දරන්නන්) නියෝජනය කරන අව්‍යාජ ජනතා වේදිකාවක් බවට පත් කළ හැකිය. එය සක්‍රිය සමාජ විගණන යාන්ත්‍රණයක් (Social Audit) බවට පත් කර ගැනීමේ ඓතිහාසික වගකීම ඇත්තේ ද මෙරට සක්‍රිය පුරවැසියන් සහ සිවිල් සමාජය අතේය. ගම සැබැවින්ම අවදි වුවහොත් පමණක් පද්ධතිය ශක්තිමත් වනු ඇත.



